# 65

# සාහිත්‍ය විචාරයේ මනා භාවිතය, විරල භාවිතය හා දුර්භාවිතය

*සේන තෝරදෙණිය*

'සාහිත්‍ය විචාරයේ මනා භාවිතය හා දුර්භාවිතය' යන යෙදුම මා යොදාගන්නේ මාජොරි ගාබර් (Marjorie Garber) විසින් ලියන ලද The Use and Abuse of Literature (2011)[1] නමැති සාහිත්‍ය විචාර කෘතියක ග්‍රන්ථ නාමය හා එම ග්‍රන්ථයේ සඳහන් කෙරෙන දේශනයක මාතෘකාව අනුව යමිනි. 1974 දී පවත්වන ලද එම දේශනය "සාහිත්‍ය විචාරයේ මනා භාවිතය හා දුර්භාවිතය" නම් වේ. මෙම දේශනය පවත්වා ඇත්තේ, ෂේක්ස්පියර් විද්වතෙකු හා සාහිත්‍ය විචාරකයකු වූ හැරල්ඩ් එෆ්. බෲක්ස්[2] විසිනි. එම දේශනයෙන් කරුණු කීපයක් ඉතා සංක්ෂිප්තව උපුටා දැක්වීම අප මෙම ලිපියෙන් සාකච්ඡා කරන සමහර කරුණුවලට ද වැදගත් විය හැකිය.[3]

i. සාහිත්‍ය විචාරයේ අර්ථය වන්නේ, සාහිත්‍යය ලිවීමට හෝ කියවීමට හෝ සාහිත්‍යය ඔස්සේ එය අයත් වන ශිෂ්ටාචාරය අවබෝධ කොට ගැනීමට හෝ අපට උපකාරි වීමයි;

ii. කෘතිය පැරණි ඓතිහාසික යුගයක් පිළිබඳ ව නම්, වචන හා සන්දර්භය වැරදි ලෙස වටහාගැනීමෙන් මුදවාලීමට හොඳ විචාරකයා, ප්‍රබල පෙළක් හා සටහන් සැපයීමට උපකාරි වෙයි;

iii. පාඨකයාගේ අගතීන් අවබෝධ කොට ගෙන, ඔහුට අනුගමනය කළ හැකි නවමු ප්‍රවිෂ්ටයක් වර්ධනය කොට ගැනීමට විචාරකයාට හෝ පාඨකයාට උපකාරි විය හැකි ය; නව්‍ය හා දුර්ග්‍රාහ්‍ය දෙයින් පාඨකයා පීඩාවට පත් ව ඇත්නම්, ඔහු නිසි මඟ යොමු කරවීම අපේක්ෂාවයි;

iv. සියල්ලට ම වඩා විචාරකයකුට කළ හැකි විශිෂ්ටතම සේවාව වන්නේ, කලා කෘතියක් එහි ඒකත්වයෙන් දැකීම අවශ්‍ය කරන හෙයින්, එහි සංසක්තිය හඳුනාගැනීමට පාඨකයාට හැකියාව ලබාදීමයි.

බෲක්ස් සිය දේශනයේ දී සාහිත්‍ය විචාරයේ දුර්භාවිතයන් ගැන ද සඳහන් කළේ ය.

i. පෙළක ඇති සාක්ෂ්‍යවලින් (උදාහරණ) කොටසකට පමණක් සිත යොමු කොට කෙරෙන "බාගෙට තම්බන ලද අර්ථකථන";



ii. කෘතිය අවබෝධ කොට ගැනීමට වෙහෙස නොදරා කිසියම් කෘතියක් හොඳ හෝ නරක යයි කීමට ඉක්මන් වීම;

iii. කතුවරුන්ගේ නිර්මාණයන් විශිෂ්ටතාව අනුව ශ්‍රේණිගත කිරීමට ඇති දැඩි අභිලාෂය;

iv. වෙනත් කතුවරයකු උත්කර්ෂයට නැංවීම සඳහා තවත් කතුවරයකු අපකීර්තියට පත් කිරීම; වෙනත් කතුවරයකුගේ ප්‍රශස්ත යයි අගයන දෙයක් තවත් කතුවරයකුගෙන් හෝ කෘතියකින් අපේක්ෂා කිරීම;

v. සමාජ විද්‍යාවේ අමුද්‍රව්‍යවලට වඩා වැඩි දෙයක් සාහිත්‍යයේ ඇතැයි නොසැලකීම.

මෙහි දී අප උපුටා ගත්තේ අපගේ සාකච්ඡාවට අදාළ දුර්භාවිතයන් කිහිපයක් පමණි. මෙම දුර්භාවිතයන්, මනා භාවිතයන් ලෙසින් ද, මනා භාවිතයන් දුර්භාවිතයන් ලෙසින් ද යළි වර්ගීකරණයකට ලක් කොට වඩා සාර්ථක හා ඒත්තුගැන්වීමේ තර්කණයක් මතු කොට ගත හැකි බව ගාබර් පවසයි. ඇය තවදුරටත් පවසන්නේ, 1974 සිට අද දක්වා සාහිත්‍ය විග්‍රහයේ ඉතිහාසය මේ සියලු "දුර්භාවිතමය" මං අනුගමනය කළ බව පෙන්නුම් කරන බවයි. අද්‍යතන සිංහල සාහිත්‍ය විචාරය මේ සියලු දුර්භාවිතයන්ගේ සංකලනයක් වී තිබේ. ගාබර්, බෲක්ස්ගේ සියලු අදහස් සමග එකඟ වන බවක් අපි නො කියමු. එහෙත් ඇය පවසන වෙනත් කාරණයක් අද්‍යතන සිංහල සාහිත්‍ය විචාරය ගැන කෙරෙන විමර්ශනයකට වැදගත් වේ. එනම් "සාහිත්‍යයේ මනා භාවිතය ගැන කෙරෙන ඕනෑ ම බරපතළ ගවේෂණයක්, විචාරය හා අර්ථ නිරූපණය යනු ආවශ්‍යක වූ උපකාරි හෝ පරපෝෂී චර්යාවක් නොව, කලා කෘතියේ ජීවිතයේ ම කොටසක් ය යන අදහස සැලකිල්ලට ගත යුතු ය" යන්නයි.[4] අප රට සමහර ලේඛක-ලේඛිකාවන් විචාරකයා පරපෝෂිතයකු බව ද, විචාර කාර්යය පරපෝෂී චර්යාවක් ද යනුවෙන් හඟවන ප්‍රකාශන සාහිත්‍ය සම්මානවලින් පසුව කරන බව රහසක් නො වේ. අද්‍යතන සිංහල සාහිත්‍ය විචාරයේ පවත්නා මනා භාවිතය හා දුර්භාවිතය මෙන් ම, විරල භාවිතය හා අසම්පූර්ණ භාවිතය ගැන ද මෙම ලිපිය මගින් සාකච්ඡා කෙරේ. විරල භාවිතය හා අසම්පූර්ණ භාවිතය යනු අපගේ තත්ත්වයන් අනුව එක් කරන ලද ඌන පූරණයක් වේ.

ඉහත හැඳින්වීමෙන් පසුව අපගේ විශ්ලේෂණයට එළැඹීමට අදහස් කරමු. අද්‍යතන සිංහල සාහිත්‍ය විචාරය සම්බන්ධයෙන් මෙම ලේඛකයා විසින් මීට කලින් ලියා ඇති ලිපි රාශියක්[5] එයින් එක් ලිපියක්, එනම්, 'සංස්කෘති' සඟරාවේ පළ වූ ලිපියක් ගැන පමණක් සඳහන් කරන්නේ වර්තමාන ලිපිය එහි දිගුවක් ලෙස සැලකිය හැකි හෙයිනි.[6] එමගින් ද සාහිත්‍ය විචාරයේ මනා භාවිතය හා දුර්භාවිතය හඳුනාගැනීමට හැකි වෙතැයි විශ්වාස කෙරේ.

කෙබඳු අදහස් හෝ අන්තර්ගතය වශයෙන් ඇති (මනා භාවිතය හා දුර්භාවිතය) සාහිත්‍ය විචාර ග්‍රන්ථ වර්තමානයේ දී සිංහලෙන් එතරම් සම්පාදනය වන බවක් නො පෙනේ. සාහිත්‍ය න්‍යාය, විවිධ වාද විධි හා සාහිත්‍ය විචාරය පිළිබඳ ව ඉඳහිට ග්‍රන්ථ කිහිපයක් හෝ පරිවර්තනයක් පළ වුව ද එය අඛණ්ඩව කෙරෙන කටයුත්තක් සේ නො පවතී. ඉඳහිට දක්නට ලැබෙන තවත් ප්‍රකාශන කටයුත්තක් වන්නේ, විවිධ පුවත්පත්වල හා සඟරාවල පළ වූ ලිපි ග්‍රන්ථ වශයෙන් ප්‍රකාශයට පත්වීමයි. ලේඛකයන්ගේ හා විචාරකයන්ගේ නිර්මාණ හා විචාර පිළිබඳ විචාර ග්‍රන්ථ පළවීම නැත්තට ම නැති තරම් වේ. විවිධ විද්වතුන් හා ශාස්ත්‍රඥයන් වෙනුවෙන් පළ කරන උපහාර ග්‍රන්ථවල ද සාහිත්‍ය විචාරය හා සම්බන්ධ ලිපි ද පළ වෙතත්, මේ සියල්ලෙන් ම පෙනී යන්නේ මෙම ක්ෂේත්‍රය එතරම් පෝෂිත හෝ පෝෂණය වන්නා වූ ක්ෂේත්‍රයක් නොවන බවයි.

සාහිත්‍ය විචාරය ඉතා පුළුල් විෂය ක්ෂේත්‍රයක් සේ අපි දකිමු. එයට නවකතා, කෙටිකතා, කාව්‍ය, පරිවර්තන, නාට්‍ය ග්‍රන්ථ මෙන් ම විචාරය ගැන කෙරෙන විවරණ හා අර්ථකථන ද ඇතුළත් වේ. අඛණ්ඩත්වයක් ඇති ව සිංහල කෙටිකතාකරුවන් හා කෙටිකතාව ගැන අධ්‍යයනයක නිරත ව සිටින්නේ මහාචාර්ය කුලතිලක කුමාරසිංහ මහතා පමණි. ඔහු සිංහල නවකතාකරුවන් හා නවකතාව ගැන ද අවධානය යොමු කිරීම විචාරයේ මනා භාවිතයක් වේ.

සිංහලෙන් සාහිත්‍ය විචාර ග්‍රන්ථ එතරම් පළ නොවන්නේ මන්දැයි සොයාබැලීම වැදගත් ය. එයට හේතු ගණනාවක් ම ඇත. වෘත්තීය මට්ටමේ සාහිත්‍ය න්‍යායාචාර්යවරුන් හා පූර්ණකාලීන විචාරකයන් නොමැති වීම ඊට එක් හේතුවකි. ඒ සඳහා පුහුණුව හා පරිචය ලැබූ අයගේ අඩුවක් ද පවතී. හැම විචාරකයකු ම වාගේ විචාර කාර්යයෙහි නියැළී ඇත්තේ අර්ධකාලීනව ය. සාහිත්‍ය ගුරුවරුන් මේ කාර්යයෙහි වෘත්තීය මට්ටමෙන් නොයෙදීම ද තවත් හේතුවකි. මෙහි දී සාහිත්‍ය ගුරුවරුන් වශයෙන් අප සලකන්නේ ශාස්ත්‍රාලයේ උගන්වන ඇදුරන් පමණක් නො වේ. ඔවුන් පාසල්වල ද වෙනත් විවිධ විද්‍යායතනවල ද සේවය කළ හැකිය. මේ සියලු සාහිත්‍ය ගුරුවරුන් ස්වකීය දේශන හා පාඩම්වල දී සාහිත්‍ය න්‍යාය හා විචාරය උගන්වන බවට විවාදයක් නැත. විවිධ සාහිත්‍ය නිර්මාණ ගැන දේශන ශාලාවේ දී හා පන්ති කාමරයේ දී හා නිබන්ධන පන්තිවල දී සාකච්ඡා කරන බව ද කිව යුතු නැත. ප්‍රථම උපාධි හා උසස් උපාධි සඳහා සිදු කෙරෙන සාහිත්‍ය පර්යේෂණවලදී විශ්වවිද්‍යාල ඇදුරන්ගේ දායකත්වය ද නිසැක ව ම ලැබේ. එහෙත් අඩුවකට ඇත්තේ මොවුන්ගේ දැනුම කෘති වශයෙන් එළියට නොඒමයි. විභාග-කේන්ද්‍රීය අධ්‍යයන ක්‍රමය නිසා සිසුන්ගේ ද ඇදුරන්ගේ ද වෙනත් ක්‍රියාකාරකම් ඇහිරී ඇතැයි යන්න සම්පූර්ණ සත්‍යය විය නො හැකිය. මේ බොහෝ දෙනෙකුට මුදල් උපයන කටයුතුවල හෝ ජනකාන්ත හා ජනප්‍රියවාදී කටයුතුවල හෝ යෙදීමට කාලය හරස් නොවන බව ද පෙනේ.



පවත්නා අධ්‍යාපන ක්‍රමය නිසාම - ටියුෂන් ගුරුවරුන් කිහිපදෙනෙකු හැරෙන්නට ගුරූපදේශවලට අනුව සාහිත්‍ය උගන්වන ගුරුවරුන් විනා පාසල් පද්ධතියෙන් සාහිත්‍ය විචාරකයන් බිහිවන්නේ නැත. දැනට දශක කිහිපයකට පෙර සාහිත්‍ය විචාරයේ පමණක් නොව, සාහිත්‍ය විචාර ග්‍රන්ථ සම්පාදනයේදී ද නියැළි ගුරුවරුන් සිටි බව අපේ මතකයට එයි. එබඳු ග්‍රන්ථ රාශියක් අපේ මතකයේ තිබේ. ඒවා උසස් ග්‍රන්ථය.

ලේඛක-ලේඛිකාවන්ගේ නිර්මාණ කාර්යය විශ්ලේෂණයට ලක් කරන කෘති මෙරට බිහි වන්නේ ම නැත. එලෙස ඇගැයීමට පාත්‍ර වී ඇත්තේ ලේඛකයන් අතළොස්සකි. අප මේ පවසන්නේ උපහාර ග්‍රන්ථ ගැන නො වේ. මේ අතින් බටහිර ලේඛකයන් ගැන පළ වී ඇති ග්‍රන්ථ සංඛ්‍යාව ප්‍රමාණාතික්‍රාන්ත වේ. අප්‍රිකානු ලේඛකයන් අතුරින් අචෙබෙ, සොයින්කා හා න්ගුගි ගැන පමණක් නොව, වෙනත් බොහෝ ලේඛක-ලේඛිකාවන්ගේ නිර්මාණද ගැන පළ ව ඇති ග්‍රන්ථ සංඛ්‍යාව අපමණය. පාසල්වල සාහිත්‍ය ඉගැන්වීම පරිහාණියට පත්වීමට මෙන්ම පාසල් පද්ධතිය තුළින් විචාරක-ගුරුවරුන් බිහි නොවීමට හේතු වූයේ, පාසල් පොත් ආණ්ඩුව මඟින් ලබා දීමෙන් ඇතිවූ "සාමා-අමර සින්ඩ්‍රෝමය" නිසා යයි සිතේ. එකල පෙළ පොත් ලියන ගුරුවරු රාශියක් ද පාසල් පද්ධතියේ වූහ.

ලේඛක-ලේඛිකාවන්ගේ කෘති විමර්ශනයට ලක් කෙරෙන ප්‍රකාශන දුලබ වීමට ප්‍රධාන හේතුව වන්නේ, ඒ සඳහා විචාරකයකු හෝ සංස්කාරකවරයෙකු ඉදිරිපත් නො වීමයි. මේවා තනි විචාරකයකුගේ ව්‍යායාමයක් වශයෙන් ද, ලිපි එකතු වශයෙන් ද සම්පාදනය කළ හැකිය. එලෙස නිර්මාණ විමර්ශනයට ලක්විය යුතු වැදගත් ලේඛක-ලේඛිකාවෝ අප රට බොහෝ වෙති. එය සිදු නොවීමට තවත් හේතුවක් විය හැක්කේ කිසිවෙකු ඒ සඳහා ඉදිරිපත් නොවීම මෙන් ම එය නොවැදගත් කටයුත්තක් යයි සිතන හෙයින් විය යුතුය. එය තනි පුද්ගලයෙකුගේ ව්‍යායාමයක් වේ නම් ඒ සඳහා දැඩි වෙහෙසක් හා කාලයක් ගත කළ යුතුය. සමහර විට එය වසර ගණනාවක් ගත වන ව්‍යායාමයක් ද විය හැකිය. එමෙන්ම කිසියම් ලේඛකයකුගේ හෝ ලේඛිකාවකගේ සාහිත්‍ය දර්ශනය, ලෝක දැක්ම, දේශපාලනය, නිර්මාණයන්ගේ විකාසනය අධ්‍යයනය කොට ඔහුගේ හෝ ඇයගේ නිර්මාණාවලිය ගැඹුරින් විශ්ලේෂණය කළ හැකි විචාරකයන් අප රට අල්පය. ඔවුනට ද ඒ සඳහා කාලය හා වුවමනාව හරස් වේ.

දැනට ඇති එබඳු ප්‍රකාශන කිහිපය එක්කෝ උසස් උපාධියකට සකස් කරන ලද නිබන්ධනයක් වෙයි. නැතහොත් ලේඛකයා කෙරෙහි වූ ප්‍රසාදය මත සකස් කරන ලද ප්‍රකාශන වෙයි. නොඑසේ නම් තමා බැතියෙන් වර්ණනා කරන, දේවත්වයට නැංවූ තමාගේ විපරීත මනස්වලට සරිලන දර්ශනයක් ගත්තා වූ අයෙකුගේ කෘති ගැන කරන විමර්ශනයක් වෙයි. යුරෝ-කේන්ද්‍රීය වාද විධි කරපින්නා ගත් විචාරකයන්

කිහිපදෙනෙකු මෙරට සිටිය ද ඔවුන්ගේ වාද විධිවලට අනුගත වූ ලේඛකයන්ගේ කෘති විමර්ශනය කිරීමට පවා ඔවුන් ඉදිරිපත් වී නැත.

මේ සඳහා ඇති හොඳ ම පිළියම වන්නේ කිසියම් සංස්කාරකවරයෙකුගේ සංස්කාරකත්වයෙන් ලිපි එකතු පළ කිරීමය. මෙහිදී ද සංස්කාරකවරයාට ගැටලු රාශියකට මුහුණදීමට සිදුවේ. ඒ සඳහා ලේඛකයන් තෝරාගැනීම හා ඔවුන්ගේ කැමැත්ත ලබාගැනීම පළමු හා ප්‍රධානතම අභියෝගය වේ. කිසියම් ලේඛක-ලේඛිකාවකගේ නවකතා හෝ කෙටිකතා සංග්‍රහ සියල්ල ම කියැවූ විචාරකයෝද නො සිටිති. කියවා තිබුණ ද වර්තමානයේ දී ඒවා ඔවුන්ගේ මතකයේ හෝ ළඟ නොතිබෙන්නට හෝ සොයාගැනීමට දුෂ්කර වන්නට පුළුවන. ඒ සඳහා සරල විසඳුමක් වන්නේ එක් එක් විචාරකයාට කිසියම් ග්‍රන්ථයක් ගැන විමර්ශනයක් කිරීමට යෝජනා කිරීමයි. එහෙත් එම ලිපියේ වුව ද අඩුලුහුඬුකම් තිබිය හැක්කේ, තුලනාත්මක විග්‍රහයක් කිරීම ඉන් මග ඇහිරී යන හෙයිනි. අනෙක් අතට කිසියම් ලේඛකයකුගේ දේශපාලන දැක්ම, ඔහු විසින් යොදගත් ආඛ්‍යාන රටා, ඔහුගේ භාෂා භාවිතය, ඔහු විදේශ සාහිත්‍යයෙන් හෝ සම්භාව්‍ය සිංහල සාහිත්‍යයෙන් හෝ පුරාණෝක්තිවලින් ලබා ඇති ආභාසය, ඔහු උපහාසය භාවිත කොට ඇති අන්දම හෝ කාන්තාව නිරූපණය කොට ඇති සැටි ගැන ලිවීමට නම් ලේඛකයාගේ සියලු නිර්මාණ පරිශීලනය කොට ඇති විචාරකයන් සිටිය යුතුය. ලේඛක-ලේඛිකාවන්ගේ නිර්මාණ සංඛ්‍යාව වැඩිවන තරමට මෙම කාර්යය තවත් දුෂ්කර වෙයි. බටහිර රටවල මෙන් ෂේක්ස්පියර් විද්වතුන් හෝ වෙනත් ලේඛකයකු හෝ ලේඛිකාවකගේ නිර්මාණ පිළිබඳව හෝ එක්තරා යුගයක සාහිත්‍යකරුවන් හෝ විවිධ වාදවිධිවලට අනුගත වන්නා වූ ලේඛක - ලේඛිකාවන් පිළිබඳ ව ගැඹුරින් අධ්‍යයනය කොට එම ලේඛකයා හෝ ලේඛිකාව, එම යුගය හෝ සාහිත්‍ය ප්‍රවණතා ගැන විශේෂ නෛපුණ්‍යයක් - විශේෂ ප්‍රාගුණ්‍යත්වයක් දක්වන විශේෂඥයන් අප රට විචාරකයන් අතර නොමැති ය. සිංහල නවකතාවේ ආරම්භක වකවානුව ගැන මහාචාර්ය ආරිය රාජකරුණා විශේෂඥභාවයක් ලබා තිබුණ ද ඉන්පසුව නවකතාව බෙදිය හැකි වකවානුවක් හෝ අපට නැත. මාර්ටින් වික්‍රමසිංහ, එදිරිවීර සරච්චන්ද්‍ර, ගුණදාස අමරසේකර හෝ කේ. ජයතිලක යන ලේඛකයන් පිළිබඳව විශේෂඥ විචාරකයන් අප රට ඇතැයි නො සිතේ.

ලංකාවේ විශේෂඥයන් ඇත්තේ වෛද්‍ය වෘත්තියේ පමණි. මේ නිසා ම වෙනත් වෘත්තීන්හි නියැළි අයට ද මෙරට සංස්කෘතිය උඩුයටිකුරු කොට පෙරළන්නට එවන ලද බටහිර වන්දනුකාරකයන්ට ද ව්‍යාජ විශේෂඥයන් සේ ප්‍රදර්ශනය වීමට හැකි ව තිබේ.

අප කලින් පැවසූ පරිදි බටහිර රටවල, පුරාණ ග්‍රීසියේ හා රෝමයේ සම්භාව්‍ය සාහිත්‍යය, (ඔවුන් ඒවා කියවන්නේ ද, අධ්‍යයනය කරන්නේ ද එම මුල් භාෂාවලිනි)[7] ඩාන්ටේ, ග්‍රීක නාට්‍යය, ප්‍රංශ සාහිත්‍යය, මධ්‍යකාලීන නාට්‍යය, දහහත්වැනි සියවසේ ආගමික කාව්‍ය, දහනවවැනි



සියවසේ නවකතාව, කාව්‍යය, ෂේක්ස්පියර්, ඩිකන්ස් පිළිබඳ විශේෂඥ විචාරකයෝ වෙති.[8] මෙම ලැයිස්තුව තවත් දික් කළ හැකිය. එහෙත් අප පවසන කාරණයට එය සෑහේ. අප එබඳු විශේෂඥයන් අප රට නැතැයි පවසද්දී බටහිර රටවල දැන් දැන් එබඳු විශේෂඥ විචාරකයන්ගේ කාර්යය ප්‍රශ්න කිරීම්වලට ලක්ව තිබේ. අවශ්‍ය ව ඇත්තේ විශේෂඥයන් ද? (Specialists) නොඑසේ නම් සියල්ල ගැන යමක් දන්නා සාමාන්‍යකයන් ද? (Generalists) මෙහි දී සංවාදයට භාජනය වී ඇති කාරණය වන්නේ, සාමාන්‍යකයන් වෙනුවට විශේෂඥයන් ආදේශ කිරීම සාහිත්‍ය අධ්‍යයනය විනාශයට පත් කරන්නේ ද යන්නයි. සාමාන්‍යකයෝ පරම සම්භාව්‍ය කෘති ගැන ද, විශිෂ්ට හා විශිෂ්ට නොවන කෘති ගැන ද ජනප්‍රිය සාහිත්‍යය ගැන ද, විවිධ යුගවලට හා විවිධ ෂානරවලට අයත් සාහිත්‍ය ගැන ද දනිති.

විශේෂඥයන්ගේ දැනුම හා ව්‍යායාමය කිසියම් තැනක ස්ථානගතව ඇති අතර බරපතළ ලෙස එය වෘත්තීයමය වී ඇත්තේය. ඔවුහු සාහිත්‍ය හූ දර්ශනයේ සෑම අඟලක් ම පාසා දනිති. ඔවුහු සමස්ත මහා චිත්‍රය කෙරෙහි තව දුරටත් අණසකක් නො පවත්වති; නොඑසේ නම් එය සැලකිල්ලට නො ගනිති.

දැන් ලිපියේ අවධානය වෙනත් අතකට යොමු ව පවතී. එහෙත් මේ ගැන තව දුරටත් මඳක් සාකච්ඡා කිරීම අවශ්‍යය. අපගේ වැනි කුඩා රටකට, සීමිත සාහිත්‍ය නිෂ්පාදනයක් ඇති රටකට සාමාන්‍යකයන් මෙන් ම විශේෂඥයන් ද අවශ්‍ය කෙරේ. විශේෂඥයන් නැති විට සියලු කාර්යය සිදු කිරීමට සිදු ව ඇත්තේ මෙම ලේඛකයා ද ඇතුළු සාමාන්‍යකයන්ටය. සාහිත්‍ය විචාරය එතරම් වර්ධනය නොවූ රටක, සියලු කටයුතු සාමාන්‍යකයන්ට පැවරීම විචාරයේ වර්ධනයට හේතු නො වේ. බටහිර රටවල් විශේෂඥ විචාරකයාගේ කාර්යභාරය ප්‍රශ්න කිරීමට එළැඹ තිබෙන්නේ වර්තමානයේ ඔවුන් හමුවේ පවත්නා වාස්තවික තත්ත්වයන් නිසාය.[9]

කලකට ඉහත දී බටහිර වුව ද මහා චිත්‍රය ලෙස සැලකුණේ, ග්‍රීක හා රෝම සම්භාව්‍ය සාහිත්‍යය, මුල් යුගයේ ප්‍රංශ සාහිත්‍යය හා පොදුවේ බටහිර සම්ප්‍රදාය ලෙස හැඳින්වූ කෘතීන්ය. කලකට පෙර ලංකාවේ මහා චිත්‍රය වූයේ ද පරම සම්භාව්‍ය කෘති හැදෑරීමයි. එහෙත් එම හැදෑරීම වුව ද රස, උපමාලංකාර, ඖචිත්‍යය, සංස්කෘතයේ බලපෑම, ව්‍යාකරණ විධි ආදියට සීමා විය. ලංකාවේ වුව ද වර්තමානයේ මහා චිත්‍රය එසේ නො වේ. අප සම්භාව්‍ය සාහිත්‍යය හදාරන්නේ ද වෙනත් දෘෂ්ටීන්ගෙනි. පරම සම්භාව්‍ය සාහිත්‍යයේ සොයා යන්නේ ද වෙනත් දෑය. (මේ සඳහා වුව විශේෂඥයන් සිටින්නේ නම් කොතරම් අගනේද?)

අපි යළිත් ලේඛක-ලේඛිකාවන්ගේ නිර්මාණ පිළිබඳ විචාර ග්‍රන්ථ වෙතට එළැඹෙමු. ලිපි එකතුවකට හෝ උපහාර ග්‍රන්ථයක ලිපි ලබාගැනීමේ දී බොහෝ ප්‍රමාදයන් සිදුවේ. මේ නිසා නිසි කලට ග්‍රන්ථය ප්‍රකාශයට පත් කිරීම බොහෝ සෙයින් කල් යන බව කිව යුතු නැත.

සමහර විට අපේක්ෂිත ලිපි නොලැබී යාම නිසා ඒ සඳහා විකල්ප මං සෙවීමට සිදුවනු නියතය. සමහර ලේඛකයන් මුදල් බලාපොරොත්තු වන හෙයින් ලිවීමෙන් වැළකී සිටින බව ද අසන්නට ලැබේ.

මෙබඳු ග්‍රන්ථ අලෙවි කරගත නොහැකි යයි සිතන හෙයින් ඒවා ප්‍රකාශයට පත් කිරීමට ඉදිරිපත් වන ප්‍රකාශකයෝ ද විරල වෙති. එහි කිසියම් සත්‍යයක් තිබිය හැකි වුව ද, එමගින් සාහිත්‍ය විචාරය සඳහා කෙරෙන සම්ප්‍රදානය අඩුවෙන් තක්සේරු කළ නො හැකිය. ඒවා මූලාශ්‍ර වශයෙන් අනාගත අධ්‍යයන සඳහා ඥාන මංජුසාවක තැන්පත් වන බව ද ප්‍රකාශකයන් විසින් අවබෝධ කොටගෙන ඇතැයි නො සිතේ. අනික් අතට සමහර ප්‍රකාශකයෝ උපහාර ග්‍රන්ථයක හා නිර්මාණ විමර්ශන ග්‍රන්ථයක අතර පවතින වෙනස නො දනිති. උපහාර ග්‍රන්ථ ප්‍රකාශයට පත්වන්නේ සාහිත්‍යකරුවන් හා සාහිත්‍ය ඇදුරන් වෙනුවෙන් පමණක් නො වේ. වෙනත් විද්වතුන් හා වෘත්තිකයන් වෙනුවෙන් ද පළ වූ උපහාර ග්‍රන්ථ දූන් දූන් සිල්ලර දේශපාලකයන් වෙනුවෙන් ද පළවනු දක්නට ලැබේ.

මේ සියලු කරුණු සම්පූර්ණ වුව ද, සපුරා සම්පූර්ණ කරගත හැකි වුව ද, මූලික ම හා ආරම්භක කර්තව්‍යය වන්නේ ලේඛකයකුගේ හෝ ලේඛිකාවකගේ නිර්මාණ විමර්ශනයක් කිරීමට විචාරකයකුගේ හෝ ලිපි එකතුවක් නිකුත් කිරීමට සංස්කාරකවරයකුගේ හෝ සංස්කාරක මණ්ඩලයක හෝ ඉදිරිපත් වීමයි. එබඳු සම්ප්‍රදයක් අපට නැත. ලේඛකයන් හා විචාරකයන් ද විවිධ ප්‍රශ්න නිසා වෙනත් ලේඛකයන් හා විචාරකයන්ගේ කාර්යය ඇගැයීමට මැලි වන බවද දක්නට ලැබේ.

උපහාර ග්‍රන්ථවල ද, අතළොස්සක් වූ නිර්මාණ විමර්ශන ග්‍රන්ථවල ද, සාහිත්‍ය විචාරය ඥාන මංජුසාවක බහා ලා අනාගතයට සුරැකි ව තබන වැදගත් ලිපි පළවීම සතුටට කරුණකි. විශ්වවිද්‍යාල අද ශාස්ත්‍රීය සංග්‍රහ ප්‍රකාශයට පත් කිරීමෙන් මුළුමනින් ම වාගේ වැළකී සිටීම සාහිත්‍ය විචාරයට හානි පමුණුවයි. වෙනත් ශාස්ත්‍රීය වාරප්‍රකාශනයක් සේ ඉතිරිව ඇත්තේ **සංස්කෘති** සඟරාව පමණි. එම සඟරාවට වුව ද වැදගත් ලිපි නොලැබීම, ලිපි සැපයීමට ශාස්ත්‍රඥයන්ගේ ඇති අකමැත්ත, කලට වේලාවට පළ කළ නොහැකිවීමේ ආර්ථික දුෂ්කරතා, සඟරාව තරුණ පාඨකයන් වෙතට නොයාම හා ලිපිවල කාලීන බවක් නොවීම, ඉතා දැඩි, අනම්‍ය වූ සංස්කරණ ප්‍රතිපත්තිය, සංස්කාරක මණ්ඩලයේ යම් යම් සාමාජිකයන්ගේ ප්‍රභාමත් ව පැවති චිත්තය පහ ව යාම එහි අනාගතය හා රැඳී සිටීම කෙරෙහි අභියෝග එල්ල කරයි. ලිපියක් ලිවීමෙන් පසු ව එය පළවීමට බොහෝ කාලයක් ගතවන හෙයින් ද, එම ලිපිය හෝ විචාරය පළවන විට එහි කාලීන වැදගත්කමක් නොවීම ද නිසා ලිපි ලිවීම සඳහා අභිප්‍රේරණයක් නොමැති වන බවද පෙනේ. ලිපිය තුල්‍යයන් විසින් විචාරයට හසු කරන්නා වූ ලෝක මට්ටමේ විද්වත්, වාරප්‍රකාශනවල දැඩි සංස්කරණ පිළිවෙතක් හා ලිපි පළවීමේ ප්‍රමාදයක් තිබිය හැකි වුව ද ත්‍රෛමාසිකයකට එය නොගැළපේ.



එහෙත් **සංස්කෘති**යේ ප්‍රධාන ප්‍රශ්නය එය නො වේ. ප්‍රශ්නය එයට හොඳ ලිපි නො ලැබීමයි. සාමාජිකයන් පවා ලිපි නොලියා සිටීමයි. අද පුවත්පත්වල සාහිත්‍ය අතිරේකවල වාර සඟරාවක පළ කරන මට්ටමේ ලිපි ද පළවන හෙයින් ලේඛකයා තම ලිපියක් පළ කර ගැනීමට මාස ගණනක් බලා සිටිය යුතු නැත. පුවත්පතක පළවන අර්ධ-ශාස්ත්‍රීය ලිපියක හා මෙරට වාරසඟරා ලිපියක බෙදුම් සීමාව කුමක්දැයි පැහැදිලි නැති හෙයින් ද හැම ලිපියක් ම පුවත්පත් ලිපි යයි සැලකීම ද සාවද්‍යය.[10]

රජයේ වියදමින් වාර්ෂික ව නිකුත් කරන දැවැන්ත ප්‍රකාශනවල කුමන වටිනාකමක් ඇද්දැයි තක්සේරු කොට නැත. ඒවා ද සාහිත්‍ය විචාර ප්‍රකාශන වේ.

කලින් දැක්වූ පරිදි, සාහිත්‍යය හා සාහිත්‍ය විචාරය හා අදාළ ව උසස් උපාධි සඳහා ලියන ලද පර්යේෂණ නිබන්ධ තිබිය හැකි වුවද ඒවා ප්‍රකාශයට පත්වීමක් දක්නට නැත. ප්‍රකාශකයන් ඒ සඳහා ඉදිරිපත් නොවීම හා මෙරට ඒවා අලෙවි කරගත නොහැකි යයි සිතීම එයට හේතු විය හැකිය. පසුගිය කාලයේ දී අප දුටු දෙයක් නම් ප්‍රථම උපාධිය සඳහා ලියන ලද නිබන්ධය ග්‍රන්ථ වශයෙන් බිහිවනු දැකීමයි. ඒ සඳහා එක් ප්‍රකාශක මහතෙකු ඉදිරිපත් වීම නිසා එයට මං සැලසිණ. ඒවායේ දක්නට ලැබුණේ බොහොමයක් ප්‍රාථමික මට්ටමෙන් ඔබ්බට නොගිය ඒවා බවයි. විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපාධියේ අවශ්‍යතා පූරණය කිරීමට සුදුසු විය හැකි වුව ද ඒවා ප්‍රකාශනය සඳහා නුසුදුසු බවයි. එහෙත් අප නොදන්නා වෙනත් උසස් නිබන්ධන බිහිවනවා ඇති. එබඳු උසස් නිබන්ධන කිහිපයක් අපි කියවා ඇත්තෙමු.

අප මෙතෙක් සාකච්ඡා කළ දේ සාහිත්‍ය විචාරයේ විරල භාවිතයට මෙන් ම මනා භාවිතයට හා දුර්භාවිතයට අදාළය. අපගේ ලිපියේ හැඳින්වීම පිටිවහල් කොට ගත යුත්තේ විචාර ලිපිවල හා ප්‍රකාශනවල අන්තර්ගතය විමසීමේ දී ය.

සමහර ලේඛකයෝ - විශේෂයෙන්ම පරිවර්තකයෝ - සිය පෙරවදන් මඟින් සාහිත්‍ය අධ්‍යයනයට මනා ආලෝකයක් ලබා දෙති. මේ සමහර පෙරවදන් ඉතා දීර්ඝය. තමා පරිවර්තනය සඳහා තෝරා ගත් ග්‍රන්ථය හැරෙන්නට, එහි කතුවරයාගේ වෙනත් කෘති, ඔහුගේ ලෝක දැක්ම, ඔහු සිය රටෙහි සාහිත්‍යයෙහි ස්ථානගත වී ඇති අයුරු හා එරට සාහිත්‍යය ගැන නොදන්නා පරිවර්තකයාට කළ හැක්කේ පරිවර්තනය ඉදිරිපත් කිරීම පමණි. පාඨකයා බලාපොරොත්තු වන්නේ කතාන්තරයක් කියැවීමට යයි ඔවුන් සිතනවා විය හැකිය.[11]

ප්‍රසිද්ධ සාහිත්‍ය දේශන කියා යමක් අද ඇත්තේ ම නැත. කලින් කලට සාහිත්‍ය අනුමණ්ඩලය මගින් සංවිධානය කරනු ලබන දේශන සාහිත්‍යාභිලාෂීන්ගේ අරමුණු ඉටු කරන බවක් ද නො පෙනේ. විශ්වවිද්‍යාලවල පවා එබඳු සාහිත්‍ය දේශන පැවැත්වෙන්නේ දැයි නො දනිමු. **සංස්කෘති** ප්‍රකාශන සංගමය මගින් එක්තරා විශ්වවිද්‍යාලයක දී සංවිධානය කරන ලද එබඳු කතිකාවක් සඳහා සහභාගි වූයේ බාහිර

පුද්ගලයන් මිස විශ්වවිද්‍යාල ප්‍රජාව නො වේ. 1960 දශකය ආරම්භයේදී පේරාදෙණි විශ්වවිද්‍යාලයේ කලාගාරයේ පැවැත්වූ සාහිත්‍ය දේශනවලට අතුරුසිදුරු නොමැති ව විශ්වවිද්‍යාල ප්‍රජාව සහභාගි වීය. මේවා සඳහා අවට ගම්වලින් ද, මහනුවරින් ද මහ පිරිස් සහභාගි වූහ. සාහිත්‍ය සම්මානවලින් පසුව විවිධ වර්ෂවලදී කොළඹ කේන්ද්‍ර කොට ගනිමින් පැවැත්වූ කතිකා නන්දෙඩවිලි සඳහා වේදිකා සැපයීමක් වීය.

ශාස්ත්‍රාලයීය විචාරකයන් අකර්මණ්‍ය වෙද්දී හෝ ඔවුන්ගෙන් සමහරුන් පුවත්පත් විචාරකයන්ගේ ගොන්නට වැටී සිටියදී විචාරයේ අඩුව පුරවන්නේ පුවත්පත් විචාරකයන් (එනම් මාධ්‍යයට සම්බන්ධ වූ) හා ලේඛක-විචාරකයන්ය. මේ සියලු දෙනාගේ ම වාගේ වැඩි අවධානය යොමු ව ඇත්තේ නවකතාවට බව පෙනේ. කෙටිකතාව, කවිය, නාට්‍ය සාහිත්‍යය, සාහිත්‍ය පරිවර්තන හා විචාර න්‍යාය ගැන අවධානය යොමුවන්නේ ඉතා අඩු වශයෙනි. මෙ ලිපි පළවන්නේ පුවත්පත්වල සාහිත්‍ය අතිරේකවලය. හැම පුවත්පතක ම වාගේ සතිපතා සාහිත්‍ය අතිරේකයක් ඇතුළත්වීම ලේඛකයන් මෙන් ම විචාරකයන්ට ද ඉමහත් සෙතක් සලසයි. මේවාහි ද මනා භාවිතය මෙන් ම දුර්භාවිතය ද දක්නට ලැබේ. එම පිටු දෙක - හතර පවා වෙළඳ දැන්වීම්වලට හෝ ආන්දෝලනාත්මක පුවත් හා භාවාතිශය ලිපි පළ කිරීමට යොදවාගෙන වාණිජ අපේක්ෂා ඉටු කොට ගත හැකි තත්ත්වයක් යටතේ මේ ව්‍යාපාරිකයන්ගේ දයකත්වය අගය කරනු වටී. ධනේශ්වර රටවල සුවිසල් කලාගාර හා කෞතුකාගාර ඉදිකොට ඒවා පවත්වාගෙන යමින් ද කලාවන්ට අනුග්‍රහය දක්වමින් ද ඒ රටවල ධනේශ්වරය විසින් වැය කරන මහා ධනස්කන්ධය හමුවේ සාහිත්‍ය අතිරේකයක් පළ කිරීම වුව අප රට මට්ටමෙන් වැදගත්ය. මෙම සාහිත්‍ය අතිරේකවල වැදගත් විචාර ලිපි හා සම්මුඛ සාකච්ඡා පළ වේ. මෙයින් හැම විචාර ලිපියක් ම හැම සම්මුඛ සාකච්ඡාවක් ම වැදගත් යයි නො කියැවේ. සමහර සාහිත්‍ය විචාර විකෘත මනස් ඇත්තවුන්ට හොඳ විය හැකි ය. සිය ඇදුරන්ගේ කෙටිකතා සංග්‍රහ හා නවකතා උත්කර්ෂයට නංවන ලිපි ද, විශ්වවිද්‍යාලයේ නිබන්ධන පන්තියේ දී ඉදිරිපත් කළ නිබන්ධන යයි සිතිය හැකි ලිපි ද මේවායේ පළ වේ.

පුවත්පත්වල සාහිත්‍ය අතිරේකවලට සතිපතා අඛණ්ඩ ව ග්‍රන්ථ විචාර ලියන නිල විචාරකයන්ට අප මෙම ලිපියේ හැඳින්වීමේ දී සඳහන් කළ සාහිත්‍ය විචාරයේ දුර්භාවිතයන් මනා ලෙස ගැළපේ. ඊට අමතර ව, බෲක්ස් 1974 දී දක්වූවාට වඩා දුර්භාවිතයන් සතිපතා නිරීක්ෂණය කළ හැකි ය. දැනට එයින් වැළකී සිටින්නේ මෙම ලිපිය එම දුර්භාවිතයන් ලැයිස්තුගත කිරීමක් විය හැකි බැවිනි. මේ බොහොමයක් විචාර 'බාගෙට තම්බන ලද අර්ථකථන' වේ. සමහර ග්‍රන්ථ විචාර 'කටගැස්ම'ක් වද්දී ග්‍රන්ථය මත්පැන් වඩියක් සඳහා ගත් බාගෙට බැදි හෝ බාගෙට පිළිස්සූ අල පෙත්තක් හෝ අල ගෙඩියක් විය හැකිය. සතිපතා නවකතාවක් කියවා විශ්ලේෂණයකට යා හැකි ජගතා කවරෙක් ද?



කොහෙන් හෝ අහුලාගත් විදේශ නවකතාවක නමක්, එවැන්නක සංක්ෂිප්තයක් හා නවකතාවේ අංගෝපාංග හෝ ඩේවිඩ් ලොජ් (David Lodge) සිය The Art of Fiction නම් විචාර ග්‍රන්ථයේ දී[12] පෙළගැස්වූ ආරම්භය, කුතුහලය, දර්ශනය, නම්, ආත්මභාෂණය, චරිත හඳුන්වා දීම, පුනරුක්තිය, සංකේතවාදය, උත්ප්‍රාසය, ග්‍රන්ථ නාමය, ආඛ්‍යාන ව්‍යුහය, අවසානය ආදිය ගැන අසා ඇත්නම්, ඕනෑ ම ග්‍රන්ථ විචාරයකට මේවා පැස්සිය හැකිය. අපගේ අත්දැකීම අනුව එක ම කාර්යයෙහි යෙදී සිටියත් සතිපතා නවකතාවක් කියවා, ග්‍රහණය කොටගෙන විචාරයක් ලිවිය නො හැකිය. කළ හැක්කේ පෙර සටහන් කළ අච්චුවට බහා ලා නවකතාවේ නම හා විචාර ලිපියේ මාතෘකාව වෙනස් කිරීමයි. සාහිත්‍ය විචාරයේ මෙම දුර්භාවිතය තරම් වෙනත් දුර්භාවිතයක් තිබිය නො හැකිය.

ඩේවිඩ් ලොජ්ගේ ග්‍රන්ථය ගැන සඳහන් කළ හෙයින් වෙනත් විචාර දිශාවකට යොමුවීමට සිතේ. ලොජ් මෙම ග්‍රන්ථය සම්පාදනය කොට ඇත්තේ තමා පෙළගස්වන විෂය ක්ෂේත්‍රවලට ප්‍රකට නවකතාකරුවන්ගේ නවකතාවලින් උපුටාගත් උද්ධෘතයකිනි. ඒ අනුව ජෝර්ජ් එලියට්, ෆොස්ටර්, තෝමස් හාර්ඩි, ජේම්ස් ජොයිස්, චාලට් බ්‍රොන්ටේ, ඩිකන්ස්, හෙමිංවේ, කුන්දේරා, ලෝරන්ස්, ඉෂිගුරෝ ආදින්ගේ නවකතාවලින් බහු උද්ධෘත ගෙනහැර දක්වයි. එයින් එක් අතකින් සාමාන්‍ය පාඨකයා වෙතට සාහිත්‍යය සමීප කෙරේ. නවකතාවේ විවිධ පැතිකඩ හා ප්‍රවණතා කෙරෙහි යොමුවෙයි. එය ශිෂ්‍යයන්ට ද අංකුර ලේඛකයන්ට ද උපකාරි වෙයි. අප නවකතා කියැවිය යුත්තේ ඇයිදැයි පෙන්වා දීමක් ද, නවකතාවේ ඉතිහාසය විදහා පෑමක් ද එමඟින් සිදුවේ.

ලොජ් එම ග්‍රන්ථයේ පෙරවදනෙහි දී ඉතා වැදගත් දෙයක් පළ කරයි. එය අප රට "දෙඩම් ගොඩ බඳ ගත් විශේෂඥයන්ට" කදිම ඉඟැන්වීමකි. ඔහු පවසන පරිදි ඔහු මෙම ග්‍රන්ථයට ඇමෙරිකානු හා ඉංගිරිසි ලේඛකයන්ගේ කෘති පමණක් තෝරාගෙන ඇත්තේ ශාස්ත්‍රාල බුද්ධිමතුන් කියන පරිදි එය ඔහුගේ ක්ෂේත්‍රය වන නිසාය. ඉන් පරිබාහිර වූ නවකතා පිළිබඳ ව නිරවද්‍ය වූ සමීප විග්‍රහයක් කිරීමට තමාට ඇත්තේ අඩු විශ්වාසයක් යයි ඔහු සිතන හෙයිනි.[13]

මේ අනුව ඔහු නවකතාවේ විවිධ අංග ලක්ෂණ සඳහා උදාහරණ සපයයි. ඉංගිරිසි විචාර ග්‍රන්ථ අතර මෙලෙස එක් එක් ලේඛකයන් මෙන් ම ඔවුන්ගේ නවකතා විවිධ වාදවිධි හඳුන්වා දෙන ග්‍රන්ථ බහුල බව කීවෙමු. එමෙන්ම නවකතාවේ විවිධ අන්තර්ගතයක් විශේෂිත ලක්ෂණ හා නවකතාව හා ඇඳුණු පුවත් දක්වන ග්‍රන්ථ ද බහුලය. අපට මෑතක දී කියැවීමට ලැබුණු එබඳු විචාර ග්‍රන්ථයක් වන්නේ එළිසබෙත් ලේඩන්සන්ගේ (Ellsabeth Ladenson) Dirt for Art's Sake, Books on Trial from Madame Bovary to Lolita ය.[14] මෙහි කලක දී අසභ්‍ය යයි හඳුන්වා දෙන ලද නවකතා අරබයා වූ විවේචන හා නඩු විනිශ්චයන් ගැන ද

සඳහන් වේ. අප රට පාඨකයන්ට ද හුරු ෆ්ලෝබෙයාර්ගේ **මදම් බොවාරි**, ජේම්ස් ජොයිස්ගේ **යුලිසිස්**, ලෝරන්ස්ගේ **ලේඩි චැටර්ලීස් ලවර්**, හෙන්රි මිලර්ගේ **ට්‍රොපික් ඔෆ් කැන්සර්**, නබුකොව්ගේ **ලොලිටා** ඇතුළු නවකතා හතක් ගැන මෙහි විස්තර වේ. මෙමගින් කියැවෙන්නේ එක් පරම්පරාවකට "කසළ" වූ දෙයක් තවත් පරම්පරාවකට "කලාව" වන බවයි; නූතන ලෝකයේ වඩාත් විවාදපන්න සාහිත්‍යය වටා බැඳුණු ඉතිහාසය හා සංස්කෘතිය ගැනයි; මුල දී දහජරාව සේ සලකන ලද කෘති පසු ව අග්‍ර කෘති සේ උත්කර්ෂයට නැංවූ වෙනස්වන සංස්කෘතික වාතාවරණය ගැනයි. ඇය ප්‍රශ්න කරන්නේ අසභ්‍ය කෘති සේ තහනම් කරන ලද කෘති පසු ව සම්භාව්‍ය සාහිත්‍ය කෘති වූයේ කෙසේ ද යන්නයි.

මා මෙම ග්‍රන්ථය ගැන සඳහන් කළේ ද ඉංගිරිසියෙන් පළවන සාහිත්‍ය විචාර ග්‍රන්ථවල විවිධ මංපෙත් ගැන පැවසීමටය. අප රට ස්වර්ණ පුස්තක සම්මානය බලාගෙන කුණුහරුප ලියන ලේඛක-ලේඛිකාවන්ගේ කෘති අනාගතයේදී සම්භාව්‍ය තත්ත්වයට උත්කර්ෂයට නැංවෙන පරිදි සංස්කෘතික වාතාවරණය වෙනස්වන බව නො වේ. කතුවරිය එයට ද සිය පෙරවදනේ දී පිළිතුරක් දෙයි. "කුණු පොත් තවමත් අප අතර පවතී; එහෙත් මෙම පදය තව දුරටත් යුලිසීස් වැනි කෘති සඳහා නො යෙදෙයි." ඒවා තවදුරටත් "කසල කසල සඳහා" සේ (dirt for dirt's sake) පවතිනු ඇත.

අප මේ අතුරු විග්‍රහයට එළැඹියේ සාහිත්‍ය විචාරකයාට කොතරම් මංපෙත් විවෘත ව ඇද්දැයි යළි පැවසීමටය. මෙලෙස විදේශීය ලේඛකයන් ද ඔවුන්ගේ නිර්මාණ ද සිංහල පාඨකයාට හඳුන්වාදිය හැකිය. මේ සඳහා කදිම ආරම්භයක් කළේ **බටහිර ශ්‍රේෂ්ඨ නවකතා** හා **සාහිත්‍ය සේසත්** ආදි කෘති සම්පාදනය කළ ජී.බී. සේනානායකයි.

එකල පරම්පරාවේ වැඩිදෙනා විශ්ව සාහිත්‍යයට ආකර්ෂණය වූයේ මෙම කෘති නිසාය. අප යෝජනා කොට සිටින්නේ මේ අයුරින් සිංහල ලේඛක-ලේඛිකාවන්ගේ නිර්මාණ පිළිබඳ ව ද කෘති සම්පාදනය කළ හැකි බවයි. ටෙනිසන් පෙරේරා විදේශීය ලේඛකයන් කිහිපදෙනෙකු ගැන එසේ ග්‍රන්ථ සම්පාදනය කොට තිබේ. ඔහු සිංහල ලේඛකයන්ගේ යම් යම් තෝරාගත් කෘති පිළිබඳ ව ද පුවත්පත් සඳහා ලිපි ලියා ඇත. සහෝදර ලේඛකයකු ගැන ලිවිය හැක්කේ මමංකාරය දුරු කරගත් විචාරකයකුට පමණි. විදේශීය ලේඛකයන් හා මියගිය ලේඛකයන් ගැන ලිවීමට නම් ඕනෑ තරම් සොයාගත හැකිය. කෆ්කා, කුන්දේරා, මාකේස් ඔවුන්ගේ ඉස්ප්‍රීතු සාන්තුවරයන් වන නිසාය.

සාහිත්‍ය දේශන නොපැවැත්වෙන වකවානුවක දී එම අඩුව පිරවෙන්නේ නිතර පැවැත්වෙන පොත් එළිදැක්වීමේ උත්සවවල දී ය. (වර්තමානයේදී එම සිදුවීමට සමහරු 'ජනගත කිරීම' යන අපභ්‍රංශය යොදති. එදා නම් 'ජනගත' කෙරුණේ සහල් සලාක පොතයි. එය ළදරු ලොකු කුඩා, බාල මහලු, දුප්පත්-පොහොසත් සැමට ම ලැබුණු හෙයිනි)



බොහෝ සෙයින් නවකතා විචාරයට ලක් කෙරෙන මාධ්‍යයක් වී ඇත්තේ ද එයයි. එහෙත් බොහෝ තැන්වලදී සිදුවන්නේ කෘතිය විශ්ලේෂණය කිරීමකට වඩා දේශකයාගේ චින්තන කොක්කණය දිග හැරීමයි. එය විටෙක ඔහුගේ චාතුර්යය (වෙනත් වචනයෙන් කියනවා නම් වාචාලකම) ප්‍රදර්ශනය කිරීමකි. දේශකයා හොඳ විචාරයක් කළ ද එය විචාරයක් වශයෙන් ඉතිරි නො වේ. එසේ වීමට නම් එය පුවත්පතක හෝ වෙනත් ප්‍රකාශනයක පළ විය යුතුය. එහි දී ද බොහෝ විට ඉදිරිපත් විය යුත්තේ ලේඛකයා හෝ දේශකයාමය.

ග්‍රන්ථය නොකියවා ම පැමිණ, ග්‍රන්ථය පසෙක තබා පාණ්ඩිත්‍යය විදහා පෑම ග්‍රන්ථයට හා කතුවරයාට පමණක් නොව ආරාධිතයන්ටද කරන නිගාවකි. තම පාණ්ඩිත්‍යය හෝ වාචාලකම පෙන්වීම සාහිත්‍ය විචාරයට කිසිවක් ඉතිරි කර නො දෙයි. ග්‍රන්ථය ගැඹුරින් කියවා අධ්‍යයනය කොට සවිස්තර විශ්ලේෂණයක් කිරීම ගැන සමහර සාහිත්‍ය පිටු සංස්කාරකවරුන් සිය අප්‍රසාදය පළ කොට ලියූ බව අපට මතකය. ඔවුන්ට අවශ්‍ය ග්‍රන්ථය ගැන කෙරෙන විශ්ලේෂණයක් නොව ව්‍යාජ න්‍යායන්ගෙන් පොත දවටා එය සුරුවමක් කොට පාඨකයාගෙන් ඈත් කොට තැබීමයි. ග්‍රන්ථය ගැන කෙරෙන විග්‍රහ නිසා සහභාගි වූවන් ග්‍රන්ථය මිලයට නොගන්නේ යයි පැවසීම සාහිත්‍යය ගැන නොදන්නා බව හඟවයි. කෙනෙකු දේශනයකට සහභාගි වන්නේ දේශනය ඇසීම පඨනයනට හිලව් කිරීමට නො වේ.

දූන් දූන් මේ දේශනවල දී දක්නට ලැබෙන දෙයක් නම් තමා නොරිසි ලේඛකයන්ට හා විචාරකයන්ට අවලාද නැගීම සඳහා ඒවා ලාභ වේදිකා ලෙස භාවිත කිරීමයි. තමාගේ ඉලක්කය සබාගැබේ දකින්නට නොලැබෙද්දී කෙරෙන මේ අවලාද නැගීම් ඔවුන්ගේ සදාචාරය කුමක් දැයි පෙන්වා දෙයි. දේශපාලකයන් නොමැති තැනක දී ඔවුන්ට ප්‍රසිද්ධියේ අවලාද නැගීම හා විචාරකයන් නොමැති තැනක දී ඔවුන්ට ප්‍රසිද්ධියේ අවලාද නැගීම යනු එකම දෙය නො වේ. පුවත්පතකින් හෝ වෙනත් ප්‍රකාශනයකින් සංවාදයක් ඇරැඹීම වෙනකකි. එහෙත් මේ අවලාද නගන්නේ ඒ අතින් බුද්ධිමය දිළින්දෝ වෙති. ඔවුන්ට අවශ්‍ය සබාගැබ රැළක් සේ සලකා රැළට ඇමතීමටය.

සාහිත්‍ය සම්මුඛ සාකච්ඡා අද සෑම සාහිත්‍ය අතිරේකයක ම වාගේ දක්නට ලැබෙන්නකි. සාහිත්‍ය නිර්මාණය හා විචාරය හා අදළ ව විද්වතුන්, ලේඛකයන් හා විචාරකයන් විසින් මෙසේ තම අදහස් පළ කරනු ලැබේ. සාහිත්‍ය සම්මුඛ සාකච්ඡාවක වැදගත්කම හා නිරවද්‍යතාව රඳා පවතින්නේ සම්මුඛ සාකච්ඡාකරුවාගේ නිපුණතාව මතය. එය ප්‍රගුණ කරගත යුතු නිපුණතාවකි. මෙතන්හි දී සාහිත්‍ය සම්මුඛ සාකච්ඡාවක් පවත්වන ආකාරය ගැන උපදෙස් දීම මෙම ලේඛකයාගේ අරමුණ නො වේ. සාහිත්‍ය සම්මුඛ සාකච්ඡාවක අන්තර්ගතය ගැන කීම අරමුණයි. සම්මුඛ සාකච්ඡාවල පෙර සූදානමේ, ප්‍රශ්න සකස් කොට ඇති ආකාරයේ, ප්‍රශ්නවල අනුපිළිවෙළේ, ප්‍රශ්න අසා ඇති ආකාරයේ හා ප්‍රතිචාර

සංක්ෂිප්ත ව ගොනු කොට ගැනීමේ හා වාර්තා කිරීමේ හා පෙරළා ප්‍රශ්න නැගීමේ අඩුලුහුඬුකම් හා දුර්වලතා දක්නට ඇතත්, අද එය සාහිත්‍ය සංකථනයේ වැදගත් අංගයක් වී තිබේ. සාහිත්‍ය සම්මුඛ සාකච්ඡා ඇතුළත් මනා ග්‍රන්ථ විදේශ රටවල ප්‍රකාශයට පත් ව තිබේ. එබඳු ග්‍රන්ථ කිහිපයක් කලකට ඉහත දී ලංකාවේද ප්‍රකාශයට පත්විය. සාහිත්‍ය සම්මුඛ සාකච්ඡාවල දී සාහිත්‍ය නිර්මාණය හා විචාරය පිළිබඳ ව ඉතා වැදගත් අදහස් ඉදිරිපත් වේ. මේ වැදගත් අදහස් එක්තැන් කිරීම අවශ්‍ය කෙරේ. මේවායේ දී ඉදිරිපත් කෙරෙන අදහස්වලට ප්‍රතිචාර හෝ ඌනපූරණ ඉදිරිපත් කිරීමේ අවස්ථා තිබිය යුතුය. එය සාහිත්‍ය සංකථනය ඉදිරියට ගෙනයාමට බොහෝ දුරට ඉවහල් විය හැකිය.

සාහිත්‍ය සම්මුඛ සාකච්ඡාවක දී ඉතා වැදගත් අදහස් සාකච්ඡා වුව ද ඒවාට ස්ථාවර ගුණයක් නොපවතින්නේ ඒවා සංකථනයට භාජනය නොවීම නිසාය. එම නිසා ඒවා කියවා අමතක කරන ඒවා බවට පත්වේ. මේ අදහස් ලේඛකයන්ට මෙන් ම විචාරකයන්ට ද වැදගත්ය. ලේඛකයාගේ අදහස් විචාරකයා ද, විචාරකයාගේ අදහස් ලේඛකයා ද අවබෝධ කොට ගැනීමෙන් අන්‍යොන්‍ය ප්‍රතිපෝෂණයක් ඇති විය හැකිය.

සාහිත්‍ය සම්මුඛ සාකච්ඡාව ඕනෑ ම දෙයක් කීමට බලපත්‍රයක් සේ සලකා දුර්මත වැපිරීම, මමත්වය නැංවීම හා අනෙකුන්ට අවලාද නැගීම සාහිත්‍ය විචාරයේ දක්නට ලැබෙන තවත් දුර්භාවිතයකි. ලේඛකයාට සිය නිර්මාණය බිහිවූ ආකාරය හෝ එයට පාදක වූ අත්දැකීම් හෝ නිර්මාණය ලියැවුණු ආකාරය හෝ තමා ඒ සඳහා යොදගත් ක්‍රමෝපායයන් ගැන කතා කිරීමට අයිතිය ඇතත් කෘතිය විනිශ්චයට ලක් කරන්නේ ඔහු නො වේ.

තමා නොදන්නා දේ කතා කිරීම ද දුර්භාවිතයක් ම වේ. ඉතා රළු හා ජුගුප්සාජනක ලෙස ස්ත්‍රී පුරුෂයන්ගේ රමණය නවකතාවලට ඇතුළත් කොට 'වික්ටෝරියානු කුහකදම්' යයි ප්‍රතිචාර දැක්වීම පෙන්වන්නේ ද සිය නොදන්නාකමයි. 'වික්ටෝරියානු කුහකදම්' ගැන අප කතා කළේ **යළි උපන්නෙමි** හා **දෙපා නොලද්දෝ** වැනි නවකතා පළවූ කාලයේ දී ය. අපි අද බොහෝ දුරක් පැමිණ ඇත්තෙමු.

අද වඩාත් ම ප්‍රචලිත ව පවත්නේ නවකතා විචාරය යයි කලින් කීවෙමු. මෙයට එක් හේතුවක් වී ඇත්තේ විවිධ සාහිත්‍ය සම්මාන විය හැකිය. මේ විචාර මුළුමනින්ම වාගේ පළවන්නේ පුවත්පත්වලය. හොඳ විචාර එකතු කොට ග්‍රන්ථ සම්පාදනය කිරීමත් දක්නට නො ලැබේ. ග්‍රන්ථ සම්පාදනය වුව ද ඒවා විචාරයේ දුර්භාවිතයන්ට නිදසුන් වී තිබේ. සාහිත්‍ය විචාරයේ දුර්භාවිතය මැනවින් දක්නට ලැබෙන්නේ සාහිත්‍ය සම්මාන යාන්ත්‍රණය ක්‍රියාත්මක වීමත් සමඟිනි. සමහර ලේඛකයෝ සිය කෘතිය මුල් කොට ගෙන මහා මාධ්‍ය මෙහෙයුම් අරඹති. වෙනත් නවකතාකරුවන් හා නවකතාවලට එරෙහි ව කැලෑ පත්තර ගැසීමට පෙළඹීම දුර්භාවිතයේ අගාධයට පත්වීමකි. ලේඛකයෝ තමාගේ කෘතිය



වෙනුවෙන් පෙනී සිටිති. කෘතිය නොතේරුණු කල්හි අවලාද නැගීම අරඹති. සාහිත්‍ය සම්මාන සමීක්ෂකයෝ ද එකිනෙකාට අවලාද නඟා ගනිති. තමාගේ විනිශ්චයන් වෙනුවෙන් ප්‍රසිද්ධියේ දේශන පවත්වමින් පෙනී සිටිති. පුවත්පත් ලිපි ලියති. ප්‍රකාශ නිකුත් කරති. සම්මානලාභියෝ විචාරකයන්ට ද අවලාද නගති. තම ග්‍රන්ථය උත්කර්ෂයට නැංවූ මිතුරන්ට පසසති. මේ විෂම චක්‍රය තරම් සාහිත්‍ය නිර්මාණයේ හා විචාරයේ වෙනත් දුර්භාවිතයක් නැති තරම්ය. මෙයින් නොනැවතී සමහර සම්මාන ප්‍රදනය කරන්නෝ තමාගේ තේරීම විශිෂ්ට යයි කියා ලියති. මේ සමහර සම්මාන පුද්ගල කේන්ද්‍රීය වේ. අධිපතිවාදී වේ. ඒවා ද හැඳින්විය යුත්තේ විද්‍යායතනයක නමින් නොව පුද්ගල නාමයකිනි. සාහිත්‍ය සම්මානය යන්න උස්තැනක ලා යළි පිහිටුවිය හැක්කේ මේ දුර්භාවිතයන් සහමුලින් ම ඉවත ලා මනා භාවිතය දෙසට හැරීමෙනි.

අද බොහෝ සෙයින් විදේශ ග්‍රන්ථ සිංහලයට පරිවර්තනය වේ. මෙලෙස පරිවර්තන කෙරෙන්නේ කුමන අරමුණක් ඇතිව ද යන්න පැහැදිලි නැතත්, පරිවර්තන ගැන ප්‍රමාණවත් විචාරයක් සිදුවන්නේ නැත. ඒ සඳහා වෙහෙසවිය හැකි විචාරකයන් නොමැතිවීම ඊට හේතුව විය හැකිය. පරිවර්තිත ග්‍රන්ථයේ කතාව සාරාංශ කොට දැක්වීම හෝ ග්‍රන්ථයේ කතුවරයා ගැන හෝ පරිවර්තකයා ගැන ලිවීම පරිවර්තන ග්‍රන්ථයක් විචාරය කිරීම යනු නො වේ. එම විචාරකයා මුල් කෘතිය කියවා තිබීම ද, පරිවර්තනය මුල් කෘතිය හා සංසන්දනය කිරීමට ඇති හැකියාව ද මෙහි දී වැදගත් වේ. එම පරිවර්තනය මඟින් සිදුවන සංස්කෘතික හුවමාරුව කෙබඳු ද, එමඟින් සිංහල සාහිත්‍යයට කෙබඳු පෝෂණයක් සිදුවේ ද යන්න තක්සේරු කිරීමට විචාරකයා දැනගත යුතුය. නොඑසේ නම් එම විචාරය දුර්භාවිතයක් ම වේ. පරිවර්තනය ගැන කරන විචාරයක දී එමඟින් දැක්වෙන සංස්කෘතිය ඉතිහාසයේ කාලවකවානුව ගැන හා වෙනත් සටහන් ඉදිරිපත් කිරීමට විචාරකයා සමත් විය යුතුය.

අද සිදුවෙමින් පවතින පරිවර්තන දෙස බලන විට පරිවර්තන කාර්යය ද දුර්භාවිතයක් වී ඇත. මේ පරිවර්තනය බොහෝමයක් අවර ගණයේ කෘති මුල් කොට ගත් ඒවාය. ඒවාට විශ්ව සාහිත්‍යයේ හිමිවන තැන සැක සහිතය. මේ සමහර පරිවර්තකයන් තමා පරිවර්තනය සඳහා තෝරාගත් කෘතිය මීට පෙර කිහිප වතාවක් ම සිංහලයට පරිවර්තනය වී ඇති බවවත් නො දනිති. (මෙයින් එක් කෘතියක පරිවර්තන ගණනාවක් තිබිය නොහැකි යයි අදහස් නො කෙරේ)

මහා විශිෂ්ට පරිවර්තකයන් යයි සන්නම් ගසන ලද පරිවර්තකයෝ ද මෙරට වෙති. ලතින් අමෙරිකානු නවකතාවක් හෝ මායායථාර්ථවාදී නවකතාවක් හෝ ලංකාවට නුහුරු ලේඛකයකුගේ කෘතියක් හෝ පරිවර්තනය කළ නිසා ම කිසිවෙක් මහා පරිවර්තකයෙක් නො වන්නාහ. කෘතියක් සිංහලයට හඳුන්වාදීම යනු වෙන ම ම දෙයකි.

එම පරිවර්තනය ගැන කෙරෙන විචාරය අනෙකකි. පරිවර්තන ගැන මනා විචාරයක් නොමැති ව පරිවර්තනවල පවත්නා දෙස් මඟහැරෙන්නේ නැත. කිසිවෙකු මොවුන්ගේ පරිවර්තන මුල් කෘතිය ළඟ තබාගෙන මුල් කෘතියට සාධාරණයක් ඉටු වී ඇද්ද, පරිවර්තනය මුල් කෘතියේ 'නිවුන් සහෝදරයකුය' යන්න කීමට ඉදිරිපත් වී නොමැතිය.

දැන් දැන් කාව්‍ය පරිවර්තනයට පිවිසීමක් ද වැඩි වැඩියෙන් දකින්නට ලැබේ. කාව්‍ය පරිවර්තන සඳහා ද දැන් රාජ්‍ය සම්මාන ප්‍රදානය කෙරේ. මෙහිදී ද පරිවර්තනය ගැන කියනු විනා කුමක්, කෙසේ පරිවර්තනය වී ඇද්ද යන්න විචාරයට හසු නො වේ. ස්පාඤ්ඤ මුල් කව ගැන කීමට කිසිවෙකු නොදනිතත්, ඉංගිරිසියට නැංවූ චීන කවි ද, වෙනත් කවීන්ගේ රචනා ද, අමෙරිකානු ඉංගිරිසි කවි ද සිංහලෙන් පළවේ. චීන ඉතිහාසය හා දේශපාලනය, ජනශ්‍රැති, පුරාණෝක්ති හා සාම්ප්‍රදායික චීන කාව්‍යයේ විරිත් නොතකා හරිමින් පාද අටේ සාම්ප්‍රදායික චීන 'ලුශිහ්' කාව්‍යය ද බෙහෙත් සීට්ටු බවට පත් කළ පරිවර්තන ද පළවී තිබේ.[15] සමහර කාව්‍ය පරිවර්තකයන්ට මේවා මුල් චීන කවිවලට ද වඩා අගනා වීම කාව්‍ය පරිවර්තන විචාරයේ දුර්භාවිතය පමණක් නොව, එයට හිමි වන දුර්භාග්‍යය ද සනිටුහන් කරයි. කාව්‍ය පරිවර්තනය පිළිබඳ විවිධ පරිවර්තන න්‍යායධරයන් විසින් ඉදිරිපත් කොට ඇති අදහස් හා අප එකඟ වන අතර කවිය විකෘති කිරීම හෝ දූෂ්‍ය කිරීම සමාව දිය යුතු කරුණු නො වේ. කාව්‍ය පරිවර්තනය පිළිබඳ න්‍යාය කිසිදු තර්කානුකූල පදනමක නොපිහිටා බැහැර කරන බවක් ද දැන් දක්නට ලැබේ. එය තමාගේ වාසියට, තම පරිවර්තනයට අනුගත ව න්‍යාය කබායක් කොටගෙන මිම්මට කපාගැනීමක් වැන්න.

පොදුවේ ගත් කල්හි සාහිත්‍ය විචාරය හුදකලා කටයුත්තක් වී තිබේ. එක් එක් විචාරකයාගේ විචාරය ද කඩින්කඩ සිදු වනු විනා අවිච්ඡින්න ව ප්‍රකාශයට පත් නො වේ. එයට බොහෝ බාධක ඇති බව අපගේ පිළිගැනීමයි. ඉදිරිපත් කරන විචාර මතයක් පිළිබඳ ව අදෘශ්‍යමාන මිතුරන් සිටිය හැකි වුව ද, දෘශ්‍යමාන මිතුරන් දක්නට නො ලැබේ. ඇත්තේ කල්ලි හා කණ්ඩායම් කිහිපයක් පමණි. ඒවා ස්වාර්ථය සඳහා ස්වකීය නිර්මාණ උත්කර්ෂයට නංවා ගැනීම සඳහා බිහි කරගත් ඒවා මිස, සාහිත්‍යයේ උන්නතියට හෝ මත නිර්මාණයට හෝ න්‍යාය ගොඩනැගීමට හෝ වර්ධනය කිරීමට හෝ බිහි කරගත් ඒවා නො වේ. සමහර ශාස්ත්‍රාලයීය සන්ධාන උසස් උපාධි පිපාසාව නිසා ඇතිවූ වන්දිභට්ට සන්ධාන සේ පෙනේ. ඒවායේ ඇත්තේ ගුරු-ගෝල වශයෙන් පීතෘවාදී සබඳතා මිස ගුරුකුල සබඳතා නො වේ. ගුරුකුල හොඳය - ගුරුකුල පැවතිය යුතුය, යන අදහසේ මේ ලේඛකයා සිටිනා අතර පවත්නා සන්දර්භයේ දී ගුරුකුල බිහි නො වේ. සාහිත්‍ය සංගම් හෝ ලේඛක සංවිධාන ඒ දක්වා ගමන් කරන්නේ ද නැත. සම්භාව්‍ය යුගයේ සිට ගුරුකුල ලංකාවට ද අමුතු දෙයක් නො වේ. මෙවැනි පසුබිමක් යටතේ සමහරු පේරාදෙණි ගුරුකුලයක් නොතිබුණේ යයි කීම තේරුම් ගත නො හැකිය.



සහිත්‍ය විචාරයේ දුර්භාවිතය මනා භාවිතයක් බවට පත් කළ හැක්කේ අප මෙතෙක් සාකච්ඡා කළ දුර්භාවිතයන්ට, විරල හා අසම්පූර්ණ භාවිතයන්ට පිළියම් යෙදීමෙනි. කෙටියෙන් කියනවා නම් ඒවා අත්හැර මනා භාවිතයක් වෙතට එළැඹීමෙනි. මේ සඳහා ලේඛක-විචාරකයන්ගේ, මාධ්‍යවේදී-විචාරකයන්ගේ, ශාස්ත්‍රාලයීය-විචාරකයන්ගේ, ලේඛකයන්ගේ හා පරිවර්තකයන්ගේ අන්‍යෝන්‍ය ක්‍රියාකාරකම් අවශ්‍යය. සාහිත්‍ය සංකථනය පුළුල් විය යුතුය; සාහිත්‍ය අධ්‍යයනයට මුල් තැනක් දී ක්‍රියාකාරකම් කළ යුතුය. වැඩියෙන් ප්‍රකාශන අවශ්‍ය වන්නේ මේ උදෙසාය.

## සටහන්

1. Marjorie Garber, The Use and Abuse of Literature (New york : Pantheon Books, 2011) මාජොරි ගාබර්, හාවර්ඩ් විශ්වවිද්‍යාලයේ ඉංගිරිසි හා දෘශ්‍ය හා පාරිසරික අධ්‍යයන පිළිබඳ මහාචාර්ය ධුරය ද නාට්‍යමය කලා වැඩසටහනේ විශ්‍රැපක ධුරය ද දරන්නීය.

2. බෘක්ස් විසින් එම දේශනය පවත්වා ඇත්තේ ඔහු ලන්ඩන්හි බර්ක්බෙක් විද්‍යායතනයේ (Berbeck College) ඉංගිරිසි සාහිත්‍යය පිළිබඳ ව විශ්‍රැපක ධුරයකට පත් කළ අවස්ථාවේ දී ය. අද එම විද්‍යායතනය, Birkbeck Institute for Humanities) නමින් හැඳින්වේ.

3. Harold F. Brooks, The Use and Abuse of Literary Criticism: An Inaugural Lecture Delivered at Berbeck College 26th June 1974 (London: Ruddock, 1974) උපුටා දැක්වීම, ගාබර් 42 - 47.

4. ගාබර්ගේ ඉහත ග්‍රන්ථය, 47 පිට.

5. බලන්නඃ රත්නදෙනියේ මේධානන්ද හිමි (සංස්.) **දුම්බර පතන් ගිනි** - සේන තෝරදෙනිය, නිර්මාණ හා විචාර විවරණ (කොළඹ : ෆාස්ට් පබ්ලිෂින් ප්‍රයිවට් ලිමිටඩ්, 2013), 518-520, 527-536.

6. සේන තෝරදෙනිය, "සුවඳ මල් හා විෂ මල් පැළැටි : අද්‍යතන සාහිත්‍ය විචාරය ගැන අදහසක්", **සංස්කෘති** 23, අංක 2 (2013 පෙබරවාරි), 78-95 (මෙම ලිපිය මහාචාර්ය කුලතිලක කුමාරසිංහ හා අමාලි බොරළුගොඩ විසින් 'නවකතාවේ පැතිකඩ' නමින් සිංහලයට පරිවර්තනය කරන ලද ග්‍රන්ථය එළිදැක්වීමේ උත්සවයේ දී පවත්වන ලද "අද්‍යතන සිංහල සාහිත්‍ය විචාරයේ පැතිකඩ හා සාහිත්‍ය විචාරයේ ගැටලු" යන දේශනය (2010.12.22) අනුව සකස් කරන ලද්දකි.

7. එකල පේරාදෙණියේ දී බටහිර සම්භාව්‍ය සාහිත්‍යය නම් විශේෂඥ විෂය ක්ෂේත්‍රය හැදෑරීම සඳහා (Western Classics) ග්‍රීක හා ලතින් භාෂා දැනුම අත්‍යවශ්‍ය වීය. බටහිර සම්භාව්‍ය සාහිත්‍යය පිළිබඳ විශේෂඥයෝ ද එහි වූහ. ඔවුන්ගෙන් කෙනෙකු වන මහාචාර්ය මර්ලින් පීරිස් සිය දැනුම සිංහල පාඨකයාට ද ලබාදීම අගය කළ යුත්තකි. එකල සිංහල විශේෂ උපාධිය සඳහා පාලි හෝ සංස්කෘත දැනුම අනිවාර්ය වීය.

8. අපේ පරම සම්භාව්‍ය සාහිත්‍යය අතැඹුලක් සේ දන්නා පඬිවරු කිහිප දෙනෙක් තවමත් අප අතර වෙති. පණ්ඩිත සිරි තිලකසිරි මහතා එබන්දෙකි.

9. මාජොරි ගාබර් පවසන පරිදි අද ලෝක සාහිත්‍යයේ ඉමහත් වූ විශ්වීය අර්ථයක් ඇත; වැඩි වැඩියෙන් අලුතින් නිර්මාණ බිහි වේ; ඒවා විචාරයට ලක් වේ; කිසිවෙකුට හෝ මේ සියල්ල කියැවිය නොහැකිය; කිසිවෙකුට ඒවායේ අණසක දැරිය නොහැකිය; පැරණි බෙදීම් හා ප්‍රවර්ග යුගය, ෂානරය, කතුවරයා ආදිය ප්‍රශ්න කිරීම්වලට භාජනය වී ඇත; වීරකාව්‍ය, ගම්බද/එඬේර යන වදන්වලට පවා නූතනවාදී හෝ පශ්චාත්-නූතනවාදී සමානාර්ථ ඇද්දැයි ප්‍රශ්න කෙරේ. (ඉහත උපුටා දක්වූ ග්‍රන්ථය, 62 - 63)

10. මෙම ලේඛකයාද **සංස්කෘති** සඟරාවේ සංස්කාරක මණ්ඩලයේ සාමාජිකයෙක් වෙයි.

11. මෙම ලේඛකයා විසින් **මරණය සහ රජතුමාගේ අසරුවා** නමින් සිංහලයට නගන ලද සොයින්කාගේ නාට්‍යයක් සඳහා පිටු 267ක දිගු පෙරවදනක් ලියා තිබේ. එහෙත් හැම පරිවර්තකයකුම එම අන්තයට යා යුතු යයි මෙයින් අදහස් නොකෙරේ.

12. David Lodge, The Art of Fiction (London : Vintage, 1992/2011) (මෙම ග්‍රන්ථයේ එබඳු මාතෘකා 50ක් ඇත. ඩේවිඩ් ලොජ් ප්‍රකට ඉංගිරිසි නවකතාකරුවෙක් හා විචාරකයෙක් ද වේ. ඔහු බර්මිංහැම් විශ්වවිද්‍යාලයේ ඉංගිරිසි සාහිත්‍යය පිළිබඳ මහාචාර්යවරයා වීය)

13. ඉහත ග්‍රන්ථය, X

14. Elisabeth Ladenson, Dirt for Art's Sake, Books on Trial from Madame Bovery to Lolita (Ithaca : Cornell University press, 2007) (කතුවරිය කොලොම්බියා විශ්වවිද්‍යාලයේ ප්‍රංශ හා තුලනාත්මක සාහිත්‍යය පිළිබඳ සහාය මහාචාර්යවරියයි.)

15. බලන්න : සේන තෝරදෙනිය, **ශිශිර වලාකුළු** - මාඕ සේතුං සහ චීන විප්ලවයේ වෙනත් නායකයන් ලියූ කවි (කොළඹ : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2010 (**කාව්‍ය පරිවර්තනය ගැන අදහසක්** - 11-40; **චීන කාව්‍ය සම්ප්‍රදය** - 41 - 66)

# 66

# යථාර්ථයේ කලාත්මක ප්‍රතිනිර්මාණය - නූතන කෙටිකතාව

*මහාචාර්ය පියසීලි විජේමාන්න*

නූතන කෙටිකතාව අද්‍යතන සමාජ රටාවේත් මානව අවශ්‍යතාවන්හිත් ප්‍රතිඵලයක් ලෙස සැකැසුණු සුවිශේෂ කලාංගයකි. එය නාට්‍යයෙන්, පද්‍යයෙන් මෙන් ම නවකතාවෙන් ද වෙනස් වූ, එයට ම ආවේණික ලක්ෂණවලින් සමන්විත සාහිත්‍ය ප්‍රභේදයකි. මානව චර්යාවන්හි යථාර්ථය කල්පිතයකින් කලාත්මකව ගම්‍යමාන කිරීම ය, කෙටිකතාවෙන් කෙරෙන්නේ. සමාජගත මිනිසා එදිනෙදා අසන, දකින, විඳින දෙයෙහි ආවරණයව පවත්නා සත්‍යතාවක් ප්‍රකට වන සේ හේතුඵල සහිතව අවයව මනාව ගළපා කෙටිකතාවෙන් ඉදිරිපත් කෙරේ.

කෙටිකතාවේ ප්‍රධානතම ආකෘතික ලක්ෂණය වනාහි එම වචනානුසාරයෙන් ප්‍රකාශිත සංක්ෂිප්තභාවය නොව විෂය ක්ෂේත්‍රානුබද්ධ වූ කාලය, පරිසරය, චරිත සිද්ධි වශයෙන් ද අඛ්‍යාන, වර්ණනා, සංවාද සම්බන්ධ වූ වචන ප්‍රමාණය අතින් ද සීමා සහිත වීම ය. නැතහොත් යථෝක්ත ඒ ඒ දෙයෙහි අනතිරික්තභාවය ය. සීමාව මේ යයි පෙන්වන සම්මත නීති පද්ධතියක් නැත. යට කී කිසියම් අංගයක වැඩිකමක්, අනවශ්‍යතාවක් කෙටිකතාවේ ඇතොත් එය හොඳින් ඉස්මතුව පෙනෙයි. සුළු අනරික්තයකින් වුව කතාවේ කලාත්මක ගුණයට හානි පැමිණේ. කෙටිකතාව විශිෂ්ට සාහිත්‍යාංගයක් බවට පත්ව ඇත්තේ ද අවයවයන්ගේ අනතිරික්තභාවය රැක ගෙන අභිප්‍රේතාර්ථය ගම්‍යමාන කිරීමට රචකයා දක්වන සැලකිල්ල නිසා ම ය. ජීවිතය සම්බන්ධව තමා පසක් කළ සත්‍යය සීමිත රාමුවක් තුළ ලේඛකයා ඉතා පැහැදිලිව ප්‍රබලව පාඨකයාගේ සිත ඇද-බැඳ ගන්නා පරිද්දෙන් චිත්‍රණය කළ යුතු ය. මේ අනුව කෙටිකතාව අරුත් රසයෙන් සපිරි සම්පිණ්ඩිත ජීවිත විවරණයකි.

තම සුපුරුදු දෛනික කටයුතුවල නිරතව සිටිද්දී ලේඛකයා සිද්ධියක් දකියි. නැති නම් සිද්ධියක් ගැන ඔහුට අසන්නට ලැබේ. සියුම් වින්දනයකින් හා තියුණු නිරීක්ෂණ ශක්තියකින් යුක්ත හේ යථෝක්ත සිද්ධිය සම්බන්ධ චරිතයේ හෝ චරිතවල හෝ හැසිරීම මෙහෙයවනු ලබන බලවේග ද ඒ බලවේග විනිවිද ගොස් යථාර්ථය ද වටහා ගනියි. මේ යථාර්ථය පිළිබිඹු වන සේ කෙටිකතාවක් ලිවීමට අදහස් කරන රචකයාට එතැන් සිට වැදගත් වන්නේ ඒ යථාර්ථය මිස එය ඔහුට ප්‍රත්‍යක්ෂ කරවූ සිද්ධින් නොවේ. කෙටිකතාකරුවාගේ බැරෑරුම් කාර්යය